(ආ) වෙනත් කටයුතු සඳහා ඉන්ධන වැය ශීර්ෂය යටතේ රු.3,350,000 ක් ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.396,283 ක වියදම් පමනක් දරා රු.2,953,717 ක් හෙවත් සියයට 88 ක් ඌණ උපයෝජිතව ඉතිරිකර තිබුණි.

3.5 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් මුදල වූ රු.198,832,312 ක වටිනාකමින් සියයට 5 ක් එනම් රු.9,941,616 ක් උපදේශන ගාස්තු ලෙස වෙන්කර රු.8,671,574 ක් ගෙවා තිබුණ ද තව දුරටත් ගෙවිය යුතු රු. 1,270,041 ක මුදල 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන තුළ බැඳීම් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 2024 දෙසැම්බර් 31 දිනට අදාල රු.62,364 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම් ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි.

3.6 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් කැගල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 12 ක පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන යටතේ නව පැති විකට් ඉදිකිරීම වෙනුවෙන් රු.15,507,106 ප්‍රතිපාදනය වෙන්කර නිබු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වනවිටත් පාසල් 02 ක් සඳහා රු.2,182,347 ක් පමණක් වැය රු.13,324,759 ක් ආපසු පවරා දීමට කටයුතු කර නිබු හෙයින් වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ඉටුව නොනිබුණි.

(ආ) සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මඟින් දැදිගම රජ මහ විහාරයේ රථගාල සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,083,110 ක් වෙන් කර 2024 අගෝස්තු 08 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නිබුණද, 2024 ඔක්තෝබර් 28 දින වනවිටත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොනිබීම හේතුවෙන් ප්‍රතිපාදනය ආපසු පවරා දීමට කටයුතු කර නිබුණි.

(ඇ) කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ විවිධ කෘෂි ව්‍යාපෘති සඳහා 2024 අගෝස්තු මස වෙන් කර නිබු ප්‍රතිපාදන අතුරින් රු.7,473,407 ක් ව්‍යාපෘති සඳහා වැය නොකර ආපසු පැවරීමට කටයුතු කර නිබුණි.

(ඈ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් කඳුකර දඟකය ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 1100 ක් අවස්ථා 5කදී වෙන්කර නිබුණද, 2024 සැප්තැම්බර් 30 දිනවන විට මිලියන 568.81 ක් හෙවත් සියයට 51.71 ක් පමණක් වැය කර නිබුණි.

(ඉ) වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල හඳුනාගත් ග්‍රාම නිලධාරී වසම් 20 තුළ පිහිටි කුඹුරු වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සූර්ය විදුලි වැටවල් ගොවිසංවිධාන වලට ලබාදීම සඳහා රු.2,500,000 ක ප්‍රතිපාදන 2024 අප්‍රේල් 18 දින වෙන්කර නිබුණද,2024 දෙසැම්බර් 02 දිනවන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොනිබුණි.

3.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව නිබුණත්, ඒ අනුව කටයුතු කර නොනිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම් නිරීක්ෂණය විය .

නිතිරීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
XXIV පරිච්ඡේදයේ 04 වගන්තිය	-	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශ අනුව වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 03 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණද, හිඟ ණය ශේෂ අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.9 භාණ්ඩ සමීක්ෂණ කටයුතු

(අ) කැගල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුල ග්‍රාම නිලධාරි වසම් 573 ක් පැවතුණද, ඉන් කාර්යාල 540 ක සහ ආර්ථික සංවර්ධන නිලධාරි කාර්යාල 424 ක පමණක් 2023 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය , ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක වටිනාකම රු.324,375,000 ක් වූ වාහන 55 න් ස්ථාවර වත්කම් පිළිබඳ සමීක්ෂණයට ලක්කර තිබූ වාහන ප්‍රමාණය 47 ක් පමණක් විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉඩම් වල වටිනාකම රු.144,350,000 ක් ලෙස මූල්‍යය ප්‍රකාශන වල දක්වා තිබුණද, ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැඟිලි වටිනාකම රු.38,643,834 ක් ලෙස මූල්‍යය ප්‍රකාශන වල දක්වා තිබුණ ද භාණ්ඩ සමීක්ෂණයට ලක්ව තිබූ ගොඩනැඟිලි හා ඉදිකිරීම් 06 ක වටිනාකම රු.396,263,571 ක් විය.

3.10 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වූවද,දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අත්තිකාරම් ලේඛනය අනුව නිලධාරීන්ට අවස්ථා 15 කදී ලබා දී තිබුණු එකතුව රු.219,040 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 11 සිට දින 34 ක් දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

3.11 තැන්පතු

(අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 2023 වර්ෂයට පෙර ලැබී තිබූ තැන්පතු මුදල් රු.43,732,215 ක් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර, ලද මුදල් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව විගණිත දින දක්වා අත්පත් කර ගැනීමේ කටයුතු අවසාන කර නොතිබුණි.

(ආ) රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාල මණින් ක්‍රියාත්මක වන වැඩසටහන් 2 ක් වෙනුවෙන් 2024 අගෝස්තු 29 දින රු.800,000 ක මුදලක් ලැබී තිබුණු අතර, 2025 මාර්තු 05 දින වනවිටත් රු.402,445 ක මුදලක් වියදම් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

3.12 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව 2024 දෙසැම්බර් මස වෙනුවෙන් පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව නිකුත් කල නමුත් ආදායකයා විසින් ඉදිරිපත් නොකල චෙක්පත් වටිනාකම් රු.39,948,854 ක් තුල ආදායකයා වෙත දෙසැම්බර් මස නිකුත් නොකරන ලද චෙක්පත් 162 ක වටිනාකම රු.10,935,893 ක්ද, අත්සන් කර නොමැති චෙක්පත් 66 ක වටිනාකම රු. 4,655,852 ක් වූ බැවින් එම චෙක්පත් අතරැඳි චෙක්පත් ලෙස නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ට අදාලව වෙන් වෙන් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකි පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම හේතුවෙන් රු.303,237,005 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර සහල් බෙදාදීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවෙන් ලද රු.527,411,340 ක් වටිනාකමැති වැඩසටහන් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් කරමින් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) ජාතික සමගිය හා ප්‍රතිසංවිධානය සඳහා වන කාර්යාලයේ අවශ්‍යතා අනුව,සෑම ග්‍රාම නිලධාරී වසමකටම සහජීවන සංගම් ස්ථාපනය කළ යුතු වුවද දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත ග්‍රාම නිලධාරී වසම් 573 ක් තුල සංගම් 255 ක් ස්ථාපිත කර නොනිබුණු අතර.පිහිටුවන ලද සංගම් 318 න් 255 ක්ම ලියපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උරුමය වැඩසටහන සඳහා ලද ප්‍රතිපාදන රු. 8,971,531 කින් රු 7,021,811ක් මූලධන වියදම් ලෙස ද රු.1,628,673ක් පුනරාවර්තන වියදම් ද වශයෙන් එකතුව රු.8,650,484 ක් වැයකර තිබුණ ද දිමනාපත්‍ර හා බලපත්‍ර 753 සඳහා පමණක් ඔප්පු ලබාදී තිබුණි.මීට අමතරව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල ඔප්පු බෙදාදීමට කටයුතු නොකර ප්‍රතිලාභීන් දඹුල්ල හා රුවන්වැල්ලට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් බස් රථ සඳහා රු.1,900,185 ක වියදමක්ද ශබ්ද විකාශන යන්ත්‍ර ගාස්තු හා විදුලි සැපයුම් ගාස්තු ලෙස රු.803,023 ක මුදලක් ද දරා තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා නව තොරතුරු පද්ධතියක් හඳුන්වා දී තිබුණද, දිස්ත්‍රික්කයේ විශ්‍රාම වැටුප් ලෙස වැඩිපුර ගෙවූ රු.16,179,701 ක මුදලක් 2024 දෙසැම්බර් 31 වනවිට නවදුරටත් අයකළ යුතුව පැවතුණි.

(ඈ) දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 45 ක් මඟින් ලබාදී තිබූ ණය වලින් 2024 දෙසැම්බර් 31 දිනට රු.302,985,381 ක බොල් ණය පැවතුණි. එම ණය අය කිරීමට අදාල නිලධාරීන් වෙත ණය අයකර ගැනීමේ සැලැස්මක් සකස්කර ප්‍රගතිය මාසිකව සලකා බලා පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණු අතරම 2024 වර්ෂය තුල සමස්ථ අයවීම් ප්‍රතිශතය සියයට 8.63 ක් වූවද, බැංකු 27 ක අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 1.42 සිට 8.33 ක අඩු පරාසයක පැවතුණි

(ඉ) රුවන්වැල්ල හා බුලත්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නායයෑමෙන් අවතැන්වූ පුද්ගලයින් වෙත රු.40,396,000 ක මුදලක් කොටස් වශයෙන් ගෙවීම් කර තිබුණද, යෝග්‍යතා සහතික නිකුත් කර, පදිංචි වීමට කටයුතු කර නොමැති බැවින් එම වැයකල මුදලෙහි කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) කාන්තා වක්‍රිය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටි වූ කාන්තා සමිති 602 න් සමිති 13 ක් අක්‍රියව පැවති අතර, 2024 වර්ෂය තුළ සාමාජිකයින් 22922 දෙනෙකුගෙන් 262 දෙනෙකු වෙත පමණක් රු.3,213,000 ක ණය ලබාදී තිබුණු අතර ඉන් කල් පසු වූ ණය වට්නාකම රු.1,477,818 වූ බැවින් උක්ත වැඩසටහනට අදාලව ණය නිකුත් කිරීම හා අයකරගැනීමෙහි කාර්යසාධනය අඩු මට්ටමක පැවතුණි.

(ආ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අගය එකතුකළ කුළුබඩු නිෂ්පාදන ගම්මානයක් ඇති කිරීම තුළින් අපේක්ෂිත මාසික ආදායම රු.150,000 විය යුතු වුවද උක්ත වැඩ සටහනට සම්බන්ධ වූ ප්‍රතිලාභීන් 42 ක් අතුරින් එක් අයෙක් හැර ඉතිරි 41 දෙනකුගේ මාසික ආදායම් මට්ටම රු.10,000 සිට රු.75,000 ක් දක්වා වූ බැවින් වැඩසටහනේ අපේක්ෂිත අරමුණු අත්පත් කර ගෙන නොතිබුණි.

4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 528 ක් වෙනුවෙන් ජල මීටර් ලබාදීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ,3.3,3.4.3 (ආ) 6.2 ඡේද වලට අනුකූල නොවී රු.3,198,390 ක් වැයකර ජල මීටර් 417ක් මිළ දී ගෙන තිබුණ ද ඉන් ප්‍රතිලාභීන් 280 ක ප්‍රමාණයකට ජලය ලබාදීමට කටයුතු නොකිරීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට අපොහොසත්ව තිබුණි.

4.1.5 ව්‍යාපෘති ඉටුනොකර අත්හැර දැමීම

කැගල්ල හා රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල 2018, 2021 හා 2022 වර්ෂවල අර්ධ වශයෙන් ඉදිකරන ලද රු.1,138,947 ක් වටිනාකමැති සේවා පියස් 10 ක් වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, නිෂ්ක්‍රීය වත්කම් ලෙස විගණනයට නිරීක්ෂණය විය.

4.1.6 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(ඇ) නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.183,225,195 ක් වැය කර තිබුණි.එහෙත්,ඉදිකිරීම් ප්‍රගතිය සියයට 88 ක් වීමෙන් අපේක්ෂිත අරමුණ මේ දක්වාම ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි.

(ඈ) බුලත්කොහුපිටිය හා දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිලිවල ඉදිකිරීම් නටයුතු සිදුකිරීමට අදාළව රු.මිලියන 204.48 ක් දරා නිබූ අතර, නිවැරදිව සැලසුම් සකස් නොකිරීම මත ඉංජිනේරුගේ 2024 ජූලි 10 දිනැති අභ්‍යන්තර ලිපිය අනුව අඩුපාඩු ලෙස හඟින ජල මට්ටම් ඉහළ යාමේදී සෝපානවල තුලට උල්පත් ජලය කාන්දු වීම, වාස්තු විද්‍යානුකූල සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමත කර නොනිබීම, ව්‍යුහගත සැලසුම් වරලත් ඉංජිනේරුවරයෙකු විසින් අනුමත නොකිරීම, පාංශු පරීක්ෂණ වාර්තා ලබාගෙන නොනිබීම සියළුම ව්‍යුහාත්මක කොන්ක්‍රීට් වැඩවලට අදාලව අනුමැතිය ලබා නොනිබීම හා නාගරික සංවර්ධන අධිකාරිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේද අදාල අනුමැතීන් ලබාගෙන නොනිබීම ආදී අඩුපාඩු හඳුනාගෙන නිබුණද එම අඩුපාඩු 2025 මැයි මස වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොනිබුණි.

(ඇ) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 අනුව අනුමැතියක් නොමැතිව පාදම් මහලක්ද රු.3,654,768 ක් උපයෝජනය කරගෙන ප්‍රසම්පාදනය කිරීමකින් තොරව පෙර තෝරාගත් කොන්ත්‍රාත්කරුගේම ඇස්තමේන්තුව මත ඉතිරි වැඩ සිදුකර තිබුණි.

(ඈ) බුලත්කොහුපිටිය හා දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී , රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 අනුව සියලුම සම්බන්ධිත පිරිවැය ඇතුලත් කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමටද කටයුතු නොකර සමාලෝචිත වර්ෂය දක්වා පිළිවෙලින් රු.84,678,618 හා රු.119,802,692 ක මුදලක් වියදම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස වන විටත් වැඩ අවසන්ව නොතිබුණි.

4.1.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) ග්‍රාම ශක්ති ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු සමිති 130 න් 2024 දෙසැම්බර් වන විට සමිති 120 ක ගිණුම්වල පැවැති රු.115,459,975 ක ශේෂය අදාළ අරමුණු කරා ඵලදායීව යොදා ගැනීමට කටයුතු නොකර අක්‍රියව පැවතුණි.

(ආ) වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැසිකිලි නොමැති අය සඳහා වැසිකිලි ආධාර ලබාදීම හා නිවාස ආධාරය ලබාදීම වෙනුවෙන් 2024 අප්‍රේල් 18 දින රු.3,000,000 ක ප්‍රතිපාදන හා නිවාස වල ඉතිරි වැඩ නිමකිරීමට 2024 සැප්තැම්බර් 02 රු.6,000,000 ක් ලැබී තිබුණද, 2024 දෙසැම්බර් 03 දිනවන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) නායයැමෙන් අවතැන් පුද්ගලයින් වෙත නිවාස/ඉඩම් ලබාදීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේ අවතැන්වූ පුද්ගලයින් 10 දෙනෙකු වෙත රු.4,125,000 ක මුදලක් තවදුරටත් ගෙවීමට ඇති නමුත් වැඩසටහන තාවකාලිකව අත්හිටුවීම මත එම මුදල් ගෙවීමට නොහැකි තත්වයක් උද්ගත වී තිබුණි.

(ඈ) රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම 2016 වර්ෂයේ ආරම්භකර රු.16,900,000 ක් ගෙවා තිබුණ ද 2025 මැයි 02 දින වන විටත් වැඩ නිම කර නොතිබුණි.වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු8,398,884 ක අත්තිකාරම් මුදලින් රු4,500,000 කඅත්තිකාරම් මුදලක් අයකර ගැනීමට තිබුණි.

(ඉ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දොරණුව ග්‍රාම සංවර්ධන ගොඩනැගිල්ල නේ කොළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වසර 08 කට පෙර රු.1,750,000ක් හා 2024 වර්ෂයේ දී රු.1,140,000 ක් ලෙස එකතුව ලෙස රු.2,890,000 ක් වැයකර නිබුණද, විගණිත දිනය වූ 2025 ජනවාරි 20 දින වනවිටත්, අර්ධ නිමි ගොඩනැගිල්ලක් බවට නිරීක්ෂණය විය.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) ලෙවන්ගම ටැම්පිට විහාරය සංරක්ෂණය කිරීම සඳහා රු.1,326,312.90 ක ඇස්තමේන්තුවක් සකස් කර වටිනාකම රු.1,226,020 ක ද්‍රව්‍ය 2024 දෙසැම්බර් 31 දින වනවිට මිලදීගෙන නිබුණද, 2025 ජනවාරි 17 වන හෙංනික පරීක්ෂණ දින වනවිටත් එහි ඉදිකිරීම් ආරම්භ කර නොනිබුණි.

(ආ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වරාවල වැකඩ පානීය ජල දිගුව ඉදිකිරීම මඟින් පවුල් 300 ක් සඳහා ජලය ලබාදීමට මූලික අදියර වශයෙන් කාණු කපා නල පද්ධතිය ඉදිකර ජලය ලබාදීම වෙනුවෙන් අනාරක්ෂිත මුදලක් රඳවා නොගෙන මුළු වටිනාකම වූ රු.21,500,000 ක් මුදලක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා නිබුණද 2025 ජනවාරි 17 දින වනවිටත් ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කරගෙන නොනිබුණි.

(ඇ) වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උඩුවක පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථානය අසලින් දිවෙන මාර්ගයේ ආරක්ෂිත පැනි බැමීම ඉදිකිරීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන වටිනාකම රු.1,000,000 ක් 2024 අප්‍රේල් 18 දින ලැබී නිබුණද, අදාල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නොනිබීම මත ව්‍යාපෘතිය අතහැර දමා නිබුණි.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන සැලැස්ම පරීක්ෂාව

(i) 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වැය විෂයන් 04 ක් සඳහා රු.295,100,000 ක ප්‍රතිපාදනයෙන් රු.124,741,973 ක් වියදම් දරා නිබුණු බැවින් ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය ඕයයට 43 ක් වැනි අවම අගයක පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීම වෙනුවට නව්‍ය අගයන් පදනම් කර ගනිමින් සංශෝධනය සැලැස්ම සකස් කර තිබුණද අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.2 ප්‍රකාරව ඇස්තමේන්තුගත කාල සටහන් නිතිපතා යාවත්කාලීන කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(iii) කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල අයවැය ඇස්තමේන්තුව අනුව 2025 ,2026 වර්ෂ සඳහා පිළිවෙලින් මූලධන වියදම් ලෙස රු.125,000,000 ක් සහ රු.135,000,000 ක් ප්‍රරෝකථනය කර තිබුණද, එම අගයන් පදනම් කරගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) (ආ) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.4 වක්කම් කළමනාකරණය

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අඩක් නිමකල සේවා පියස් 19 ක් වසර 01 සිට 10 දක්වා කාලයක් අභාවිතව පැවතීම නිසා ඒ වෙනුවෙන් වැය කල රු.13,398,639 ක වියදම් අනාර්ථික වී තිබුණි.

(ආ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් ඒකක 07 ක ස්ථාපිත ගොඩනැගිලි ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණද, එම ඉඩම් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

4.5 රජයේ නිලධාරීන් ඇප කැබීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සමෘද්ධි බැංකුවල සේවය කරනු ලබන නිලධාරීන් හා මහා සංගමවලින් මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

රුකාෂල් කම්බි පාලම අළුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දෙහිඕවිට පාදේශිය ලේකම් කාර්යාලය 2024 අගෝස්තු 12 දින දික්ඇල්ල වැඩිහිටි සමිතිය සමඟ ගිවිසුම් ගත වී නිබුණු අතර අදාළ සමිතිය ගිවිසුම උල්ලංඝනය කරමින් ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබාදී නිබුණි.2024 දෙසැම්බර් 31 දින අළුත්වැඩියාකිරීම් කටයුතු ආරම්භකර හෝ නොමැතිව තිබිය දී වැඩ අවසන් බවට නාක්ෂණ නිලධාරි ඉදිරිපත් කල ව්‍යාජ වාර්තා මත පදනම් ව රු.2,940,903 ක මුදලක්, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ,ගණකාධිකාරි, ප්‍රාදේශිය ලේකම්ගේ නිසි අධික්ෂණයක් නොමැතිව ගෙවීම් කර නිබුණු අතර, උප කොන්ත්‍රාත්කරු සිදු කල මිළදී ගැනීම් වෙනුවෙන් ලබාදිය යුතු රු.1,800,000 ක ගෙවීම් වෙනුවෙන් රු2,516,000 මුදලක් කාර්මික නිලධාරියාගේ පෞද්ගලික බැංකු ගිණුමට කොන්ත්‍රාත්කාර සමිතිය විසින් බැර කර නිබුණි.අළුත්වැඩියාව නිසි වේලාවට සිදු නොකිරීම නිසා අවස්ථා 4 ක දී රු.2,514,000 ක මුදලක් නැවත වැඩිහිටි සමිතිය වෙත කාර්මික නිලධාරි බැර කර නිබුණි.

4.7 පාඩු හා හානි

(අ) රුවන්වැල්ල හා බුලන්කොහුපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ආපදා අංශයට අයත් ට්‍රැක්ටරය හා බවුසරය පිළිවෙලින් 2024 මාර්තු 15 හා 2023 දෙසැම්බර් 13 සිදුවූ අනතුරු සම්බන්ධයෙන් 2025 මාර්තු 14 දින වනවිටත් අවසන් වාර්තා ඉදිරිපත් කර නොනිබුණි.

4.8 අනාර්ථික ගනුදෙනු

(අ) අරණායක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් කුළුබඩු නිෂ්පාදන ගම්මානය සඳහා අමුද්‍රව්‍ය එක් රැස්කරන මධ්‍යස්ථානය ලෙස ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.2,062,000 ක් වැයකර නිබුණ ද විගණිත දින වන 2025 මාර්තු 08 වනවිටත් එම ගොඩනැගිල්ල උපයෝජනය කර ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ආ) (i) දැරණියගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් සෙවිලි නහඩු 1904 ක් මිළදී ගැනීම වෙනුවෙන් රු.132,600 ක මුදලක් වැයකර පලකරන ලද පුවත්පත් දැන්වීමට අදාළව ආයතන 02 ක් මඟින් මිළ ඉදිරිපත් කර නිබුණද, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකිරීම හා පිරිවිතර නිවැරදිව හඳුනාගෙන නොනිබීම මත නැවත ප්‍රසම්පාදන කිරීමට සිදුවීමෙන් ඉහත පුවත්පත් දැන්වීම් සඳහා වැයකල මුදල නිෂ්ඵාර්යය වියදමක් වී නිබුණි.

(ii) ඉහත ප්‍රසම්පාදනයට අදාලව පිරිවිතර සංශෝධනය කර නැවත ලංසුකරුවන්ට දැන්වීමට කටයුතු නොකිරීම හා ලියාපදිංචි සැපයුම්කරුවන් සියල්ලන්ගෙන් නැවත මිළ කැඳවීම වෙනුවට සැපයුම්කරුවන් 14 දෙනකු වෙතින් පමණක් මිළකැඳවීමත්, ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දීම වෙනුවට දින 07 ක් ලබා දීමත් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාව විගණිත දින වන 2025 අප්‍රේල් 08 වනවිටත් හඳුනාගැනීමට කටයුතුකර නොතිබීම හා බෙදා හැරීමට කටයුතු සිදු නොකිරීම මත විශේෂ සන්නාමය සලකා මිළදි ගැනීමට කටයුතු කිරීම මත රු2,779,840 පාඩුවක් සිදුව තිබුණි.

(ඇ) කැගල්ල දිවෙල වසමේ 2018 වර්ෂයේ ආරම්භකල ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම අත්හැර දැමීම නිසා ඒ වෙනුවෙන් රු.1733622 ක් වැයකර ඉදිකළ ජල ටැංකිය අභාවිතව පැවතුණි.

4.9 කළමනාකරණ දුර්වලතා

(අ) රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශිය ලේකම් වෙත කුලී පදනම මත නිවාසයක් ලබාදීමේදී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 අනුව වැටුපෙන් අය කළ යුතු සියයට 10 ක වටිනාකම වූ රු.340,817 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කැගල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුළ දහම් පාසල් 612 න් අක්‍රිය දහම් පාසල් ගණන 12ක් විය. ගුරුවරුන් 6835 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගුරු දීමනා ලෙස රු.25,715,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද 06 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වූ 34,720 න් විභාගයට පෙනී සිටි ගණන 26,162 ක් වූ අතර, ඉන් W (අසමත්)සමාර්ථ ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 4140 ක් හා S සමාර්ථ ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 7365 කි. ඒ අනුව S හා W සාමාර්ථ ලබාගත් මුළු පිරිස විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 44 ක් වැනි ඉතා පහල අකාර්යක්ෂම අගයක් ගෙන තිබුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පැවැත්වූ ඉඩම් කච්චේරි වලට අදාලව ඉඩම් කොමසාරිස් ජනරාල්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබූ කෘෂිකාර්මික කටයුතු, නේවාසික කටයුතු , වාණිජ කටයුතු වෙනුවෙන් දීර්ඝකාලීන බදු දීමට අදාළ ප්‍රතිලාභීන් 104 කගේ ගොණු කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 8 ක 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරාසය තුළ නිකුත් කළ යුතු බලපත්‍ර, දීමනා පත්‍ර, ඔප්පු අතුරින් 199 ක් අතරදවා ගෙන තිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක වසා දමා තිබූ පාසල් 98 ක් අතුරින් පාසල් 29 ක භූමිය සහ ගොඩනැගිල්ල ඌණ උපයෝජිතව පැවතුණි.

(ඊ) ගංවතුර නාය යෑම් හා අධි අවදානම් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අධිඅවදානම් ලෙස නම් කරන ලද පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන අනුව 2016 වර්ෂයේ සිට අවදානම් ලෙස නිර්දේශ කරන ලද පවුල් ගණන 787 වූවද, රජයේ ඉඩම් නිවාස ඉදිකිරීම්,පෞද්ගලික ඉඩමක නිවාස ඉදිකිරීම්,ස්වේච්ඡා සංවිධාන මගින් නිවාස ඉදිකිරීම් ආදී ලෙස නැවත පදිංචි ව්‍යාපෘති සඳහා යොමු වූ පවුල් ගණන 319 ක් වූ බැවින් ඉතිරි පවුල් පදිංචි කිරීමේ අකාර්යක්ෂමතාවයක් පැවතුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යලය සතු ඉඩම් දීර්ඝකාලීන බදු පදනම යටතේ බදු දී ඇති ඉඩම් සහ වෙනත් දේපල වලින් 1997 සිට 2024 දක්වා වූ කාල පරාසය තුල රු.19,539,297 ක අයවිය යුතු බදු මුදලක් පැවතුණි.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නොදියුණු වටිනාකම් ගෙවා ඉඩම් අත්පත් කර ගැනීම් වලට අදාළව ප්‍රතිලාභීන් 13 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.6,080,720 ක හිඟ මුදලක් අයවීමට පැවතුණි.

(එ) අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල පෝෂණ මට්ටම අඛණ්ඩව පවත්වා ගැනීම හා එම ජනතාව ආරක්ෂා කර ගැනීමේ අරමුණ සඳහා මසකට කිලෝ ග්‍රෑම් 10 බැගින් මාස 02 ක කාලයක් සඳහා නාඩු සහල් බෙදාදීමේ වැඩසටහන වෙනුවෙන් සහල් මිලදී ගැනීම සඳහා රු. 513,925,190 ක්ද ප්‍රවාහන වියදම් වශයෙන් රු.8,162,157 ක් වශයෙන් එකතුව රු. 522,087,347 ක් වැයකර කැකුළු සහල් කිලෝ ග්‍රෑම් 264,750 ක් මිලදී ගෙන තිබුණද, චක්‍රලේඛය ප්‍රකාරව සහල් සැපයුම්කරුවන් තෝරා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම ,සහල්වල ගුණාත්මක නිර්ණායක හා ප්‍රමිතිය පරීක්ෂාවට විශේෂ විමර්ශන කමිටුවක් පත්කර නොතිබීම මීට අදාල චක්‍රලේඛ උපදෙස් 2.4 හා 2.5 කාණ්ඩ යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෞද්ගලිකව සැහීමට පත් වූවාද යන්න සනාථ නොවීම ප්‍රවාහන ලොරි රථවල ගෙවීම් විනිවිදභාවයක් නොතිබීම ,සමෘද්ධි ,සංවර්ධන ,ආර්ථික හා ග්‍රාම නිලධාරීන් විධිමත් ක්‍රමවේදයක් යටතේ සහල් භාර නොගැනීම වැනි ක්‍රියාවලිය තුළ කාර්ය සාධන ගැටළු පැවතුණි.

(ඒ) 2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ 06 ඡේදය අනුව දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් ඉටුවන පරිදි කටයුතු කර ගැනීමට යොදවා ගැනීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාළ සමෘද්ධි බැංකු 45 ක අක්‍රිය ගිණුම් 128831 ක වටිනාකම රු.461,583,705 ක ශේෂයක් කිසිදු ආයෝජනයක් නොමැතිව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඔ) ශ්‍රී ලංකා රජයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම " ජාතික ප්‍රතිපත්තිය අනුව ග්‍රාමීය ජනතාව මුහුණ දෙන ක්ෂුද්‍ර ණය අර්බුදයට විසඳුමක් ලබාදීම වෙනුවෙන් හඳුන්වා දෙන ලද අරුණළු සහන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ගි ප්‍රජාමුල සංවිධාන 1271 න් ප්‍රජා මූල සංවිධාන 655 ක් ක්‍රියාත්මක නොවූ අතර, වසම 573 න් වසම 342 ක සමිති 533 ක පමණක් ණය නිකුත් කිරීමට කටයුතු කර නිබුණි.

(ඕ) රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.7,808,027 ක තැන්පතු මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන නිබුණු අතර, මැනුම් ඉල්ලීම ප්‍රමාදවීම, ගැසට් නිවේදනය පල නොවීම, ප්‍රතිපාදන මුදල් ප්‍රමාණවත් නොවීම වැනි හේතු මත එම මුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු නොකර ලද මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නිබුණි.

(ක) සබරගමුව පළාත් සභාවට අයත් රු.4,199,000 ක් වටිනාකමැති ආණ්ඩුකාර නිල නිවාසය , නාගරික සංවර්ධන අධිකාරිය සතු මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි රු.23,600,000 ක් වටිනා ඉඩම, සහ දෙහිඔවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.15,250,000 ක් වටිනා ඉඩම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ග) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නොදියුණු වටිනාකම් ගෙවා ඉඩම් අත්පත් කර ගැනීම් වලට අදාළව ප්‍රතිලාභීන් 13 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.6,080,720 ක ගිහ මුදලක් අයවීමට පැවතුණි.

(ච) 2009 වර්ෂයන්ගේ සිට 2023 දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාලව ප්‍රධාන කාර්යාලයෙන් නවදුරටත් ප්‍රතිපූර්ණය කර ගත යුතු රු.327,312,036 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදීද ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොනිබුණි.

5 තිරසර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ 2023 ට අනුව ළඟා කර ගත යුතු හා ඉලක්ක කර ළඟා වීමේ සූදානම පිළිබඳ පරීක්ෂාවේදී, තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 13 ක් හඳුනාගෙන නොතිබුණද, තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2023 ට අනුව අරමුණු 04 ක් කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණි.

5.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්ගේ ආකල්පමය වෙනසක් ඇති කරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දිවයිනේ විශිෂ්ඨතම ආයතනය බවට පත් කර ගනිමින් දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමේ ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් දිස්ත්‍රික්කයේ පවතින අගයන් සමනික්ක්‍රමණය කරමින් දිස්ත්‍රික්කය තිරසර සංවර්ධනය කරා ගෙන යාම ආයතනයේ මෙහෙවර වුවත්, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තිරසාර සංවර්ධන අරමුණු වලට ලඟා වීම අවම ප්‍රගතියක පැවතුණි.

(ආ) කාර්යය සාධන වාර්තාව අනුව තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක ලෙස වයස අවුරුදු 05 ට අඩු මිටි දරුවන්, අවුරුදු 05 ට අඩු කෘෂ හා අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය, ,දිස්ත්‍රික්කය තුළ පාසල් නොයන හා කඩින් කඩ පාසල් යන දරුවන්ගේ ප්‍රතිශතය, සුරක්ෂිත ජලය පරිභරණ කරන පවුල් ප්‍රතිශතය, සනීපාරක්ෂක පහසුකම් සහිත පවුල් ප්‍රතිශතය, විදුලිය නොමැති පවුල් ප්‍රතිශතය හඳුනාගෙන තිබුණ ද 2023 සම්පත් පැනිකඩ අනුව ඉහත තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම අවම මට්ටමක පවතුණි.

6 යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) 2018 මාර්තු 21 දිනැති අංක 02/2018 (i) චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සේවා ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි සඳහා විසඳුම් ලබාදීම සඳහා යාන්ත්‍රණයක් ගොඩනැගීමට සහ එම තොරතුරු වාර්තා ගත කර මැණුම් කර බැලීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කලයුතු බව හා අදාල ප්‍රශ්නයට විසඳුම් ලබා දුන් පසුව පැමිණිල්ල ඉදිරිපත් කල පුද්ගලයාගේ අත්සන ලබාගෙන විසඳුම සත්‍ය වශයෙන් ලබාදුන් බව තහවුරු කිරීම තුලින් විනිවිදභාවය මනාව තහවුරු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කල යුතු බව දක්වා තිබුණද, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එබඳු ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව, පවතින නීති, රීති යටතේ විසඳුම් ලබාදිය නොහැකි පැමිණිලි සංඛ්‍යාව හා විසඳුම් ලබාදී ඇති පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට නිරීක්ෂණය නොවුණි.

7. මානව සම්පත් කළමනාකරණය

7.1 මානව සම්පත් ධාරිතා සංවර්ධනය

(අ) කැගල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුළ නිලධාරීන් 512 දෙනෙකු 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම එකම සේවා ස්ථානයේ රැඳි සිටින බව නිරීක්ෂණය විය. කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 244 උප ඡේදය පරිදි සෑම නිලධාරියෙකුම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද,එසේ සිදුකර නොතිබුණි.

(ආ) කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පුහුණු කටයුතු වෙනුවෙන් ලද රු.5,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.4,652,548 ක් වැය කර නිබුණ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රු.1,386,000 ක් සඳහා පුහුණු සැලැස්මක් සකස් කර අනුමත කිරීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වියදම් කර තිබූ රු.2,690,387 ක වියදමින් රු.1,614,000 ක් සඳහා අනුමත සැලැස්මක් නොතිබුණි.

(ඇ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සකස් කිරීමේදී ඉදිරිවර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන දින දර්ශණය සකස්කර නොතිබුණු අතර මානව සම්පත් සංවර්ධන සැලැස්මට අදාලව දැක්ම මෙහෙවර අභිමතාර්ථ අරමුණු හා අගයන් හඳුනාගෙන නොතිබුණි.

(ඈ) 2025,2026,2027 වර්ෂවලට අදාලව පුරෝකථනය කරන ලද ධාරිතා සංවර්ධන අයවැය ඇස්තමේන්තු වටිනාකම පිළිවෙලින් රු6,000,000 හා රු 16,000,000 රු 21,000,000 සඳහා ඉදිරිකාර්යය මණ්ඩල පුරෝකථන හා සැලසුම් සකස් කර නොතිබුණි.

7.2 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල විස්තර අනුව පුරප්පාඩු 109 ක් වූ අතර, ඒ තුළ වසම් 57 ක ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩුද පැවතුණි.

(ආ) අනුමත නොවූ තනතුරුවලට සංවර්ධන නිලධාරීන් 1306 දෙනෙකු අනුයුක්ත කර වැටුප් ගෙවා නිබුණු අතර, සේවක කලමනාකරණය කිරීමට හා වැඩ බෙදාදීමක් සිදු නොකර අනෙකුත් නිලධාරීන්ට අනිකාල හා දිමනා ගෙවීමටද කටයුතු කර තිබුණි.

එම්.ජී.මදරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස		
	100% - 90%	75% - 89%	50% - 74%
ඉඩම් හිමිකම් සහතික විකුත් කිරීම.	360.90%		
රැකියා විරහිත අඩු ආදායම්ලාභී පුද්ගලයන් රැකියාගත කිරීම	149%		
තරුණ ප්‍රජාව විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීය පුහුණුවකට ලක් කිරීම.(අබාධිත ප්‍රජාවද ඇතුලුව).	264.3%		
කුඩා පරිමාණ ව්‍යවසායකයන් හට නව තාක්ෂණය හඳුන්වා දීම,ව්‍යාපාර ප්‍රවර්ධනය ආදී කටයුතු සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම	506.2%		
අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් යන වයසේ පසුවන පාසල් අධ්‍යාපනය නොලබන දරුවන් පාසල් අධ්‍යාපනයට යොමුකර වීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.	219.2%		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

සැලසුම් අංශය - කාර්ය සාධන වාර්තාව සඳහා තොරතුරු ලබා දීම					
ඉලක්කය අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
1	1.1	1.1.1- දිළිඳු පවුල් ප්‍රතිශතය	7.56		
2	2.2	2.2.1 - වයස් අවුරුදු 5ට අඩු මිටි දරුවන් 2.2.2 - වයස අවුරුදු 5ට අඩු කෘෂ/ අඩු බර දරුවන් ප්‍රතිශතය	58.15		
	2.4	2.4.1 - පුරන් කුඹුරු ප්‍රමාණය	අක්කර 624.75		
3	3.1	3.1 මාතෘ මරණ අනුපාතය	සංඛ්‍යාව-08		
	3.2	3.2.2 - බිළිඳු මරණ	1.25		
	3.3	3.3.2,3.3.3 ක්ෂය, මැලේරියා රෝගීන් සංඛ්‍යාව	සංඛ්‍යාව-25		
4	4.1	4.1.1 දිස්ත්‍රික් පාසල් නොයන හා කඩින් කඩ පාසල් යන දරුවන් ප්‍රතිශතය	1.084		
5	5.2	5.2.1 කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන සියලුම ආකාරයේ හිංසන ප්‍රමාණය (පැමිණිළි සංඛ්‍යාව)	ළමා හිංසන සංඛ්‍යාව -356 කාන්තා හිංසන සංඛ්‍යාව-297		
6	6.1	6.1.1 සුරක්ෂිත ජලය පරිභරණය කරන පවුල් ප්‍රතිශතය		58.10	
		6.2.1 සනීපාරක්ෂක පහසුකම් සහිත පවුල් ප්‍රතිශතය			84.87
7	7.1	7.1.1 විදුලිය නොමැති පවුල් ප්‍රතිශතය	0.505		
8	8.5	8.5.1 විරැකියා අනුපාතය	9.208		
9	9.1	9.1.1 සංවර්ධනය කරන ලද මුලු මාර්ග ප්‍රමාණය (කි.මී. වලින්)	කි.මී.11494.009		
10	11.1	11.1.1 ස්ථිර නිවාස නොමැති පවුල් ප්‍රතිශතය	1.83		
11	13.1	13.1.1 ආපදා හේතුවෙන් මිය යන සංඛ්‍යාව	5		
12	14.1	14.1.1 දිස්ත්‍රික්කයේ ඇති ජල මූලාශ්‍ර සංරක්ෂණය කර ඇති ප්‍රමාණය	170		
13	15.1	15.1.1 වන ආවරණයේ ප්‍රතිශතය	23.9		
	15.8	15.8.1 ආක්‍රමණශීලී ශාක හා සතුන් ප්‍රතිශතය	_		

මූලාශ්‍ර - 2023 සම්පත් පැතිකඩ

-වනිතා සංවර්ධන නිලධාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල
- ළමා හිමිකම් නිලධාරී - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකවින් විස්තර කරන්න

	අරමුණ		ඉලක්ක
01	සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.1	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම වර්තමානයේ තක්සේරු අනුව ඩොලර් 1.5 ට වඩා අඩු ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩය අයත් වේ.
02	සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2.2	අවුරුදු 5 ට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි වීම සහ ක්ෂය වීම පිළිබඳව අන්තර් ජාතික වශයෙන් ඒකඟතාවයට පත් වූ ඉලක්ක 2025 වන විට ළඟා කර ගැනීම ද ඇතුළුව 2030 වන විට සියළුම ආකාරයේ පවත්නා මනිද පෝෂණ තත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමයින්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවයන්ට විසඳුම් ලබාදීම
		2.4	2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවැත්වීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවැත්වීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම් වලට හැඩ ගැස්වීම සඳහාවූ ධාරිතාවයන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම
03	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	3.1	2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000 ට 70 දක්වා අඩු කිරීම
		3.2	සියලුම රටවල්වල නවජාති මරණ අනුපාතිකය සජීවී උපත් 1000 ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 100 ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපත් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළකාවාගත හැකි මරණ තුරන් කිරීම
		3.3	2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපයටිටිස් , ජලය මඟින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම
04	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.1	2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රථමික සහ ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම
05	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	5.2	මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දුෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට ඒරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම

06	සැමට ජලය සහ සනීපාරක්ෂාක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	6.1	2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරාක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම
07	සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීනනවීන බලශක්ති සැපයුම සහතික කිරීම	7.1	2030 වන විට සියලුදෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බල ශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම
08	සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.5	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින්ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සූනිසි රැකියා අවස්ථාවන් ලබා දීම
09	සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	9.1	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසාර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
10	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	11.1	2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුනු කිරීම
11	දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට ඒරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම	13.1	සියළුම රටවල කාළගුණය සම්බණ්ධ විපත් සහ ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මූහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම
12	තිරසර සංවර්ධනය සඳහා සාගර, මූහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය	14.1	2030 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීමද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම පදනම් කරගත් ක්‍රියාකාරකම් මඟින් සිදුවන සියළුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් වෙනස් වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැසීමට ඔවුන්ගේ හැකියාව වැඩි කරන ඒකාබද්ද ප්‍රතිපත්ති /ක්‍රමෝපායන්/සැළසුම් සහ කාළගුණික වෙනස්වීම් හා හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීම් දියුණු කිරීම සඳහා වන කැපවීම පිළිබඳ අදහස් හුවමාරු කරගෙන ,ස්ථාපනය කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව

13	භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට ඒරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පූනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම	15.1	2030 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන් ,විශේෂ වනාන්තර , කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය නැවත නගාසිටුවීම සහ නැවත වන වගාව වර්ධනය කිරීම.
		15.8	2030 වන විට ගොඩබිම සහ ජලයේ පරිසර පද්ධතිවල වෙසෙන ආක්‍රමණික පිටස්තර ජීව විශේෂයන් අලුතින් හඳුන්වා දීම සහ ඔවුන්ගෙන් සිදු වන බලපෑම කැපී පෙනෙන ලෙස අඩු කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ මෙම විශේෂයන් පාලනය හෝ තුරන් කිරීම.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2024.12.31 දිනට කාර්ය මණ්ඩලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කෑගල්ල

සේවක	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)
ජේෂ්ඨ	15	12	පුරප්පාඩු 02
තෘතියික	4	3	පුරප්පාඩු 01
ද්විතික	93	203	අතිරික්ත 110
ප්‍රාථමික	27	27	-

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන් ලැබ ඇති ආකාරය

* යම් අවස්ථාවන්හිදි කාර්යාලය තුළ ආයතනයේ නිලධාරීන්ගේ අතිරික්තයක් පවතින විට එක් විෂයය ක්ෂේත්‍රයක් තුළ පවතින රාජකාරී වගකීම් බෙදීයාම තුළින් එම වගකීම නිලධාරීන් කිහිපදෙනෙකු අතර බෙදීයාම නිසා වගකීම් නිසි ලෙස ඉටු කිරීම සම්බන්ධයෙන් යම් යම් ගැටළු මතු වීම.නිලධාරීන්ගේ උපරිම ධාරිතාවය උපයෝගී කර ගැනීමට අවස්ථාව අවම වීම තුළ උපරිම කාර්යක්ෂමතාවය ආයතනය වෙත ලබා ගැනීමට නොහැකි වීම.
* නිලධාරී පුරප්පාඩු පැවතීම තුළ කාර්යාලයේ එක් නිලධාරියෙක් සඳහා අසීමිත වගකීම් ප්‍රමාණයක් ලැබීම තුළ රැකියා තෘප්තිමත්භාවය පහළ යාම මගින් ආයතනයේ සමස්ථ කාර්යසාධනය අඩු වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය(Rs:000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම
			දේශීය	විදේශීය		
අභ්‍යන්තර විගනණය	50	දින 01	10 565.00		දේශීය	අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුම
ධාරිතා සංවර්ධනය	100	දින 01	25 480.00		දේශීය	සාමාන්‍ය සැසිරීම හා විනය
පරිසනක පුහුණු වැඩසටහන	15	දින 02	5100.00		දේශීය	Ms Excel පුහුණු වැඩටහන
මැනුම් කටයුතු පිළිබඳ පුහුණුව	45	දින 01	10 715.00		දේශීය	දේශීය වශයෙන් ඉඩම් මැනීම සම්බන්ධ කටයුතු
ධාරිතා සංවර්ධන පුහුණුව	110	දින 01	35 450.00		දේශීය	නායකත්ව හැකියාව
නවක ග්‍රාම නිලධාරී පුහුණු වැඩසටහන	75	දින 16	328 160.00		දේශීය	ග්‍රාම නිලධාරී තනතුරු හා එහා විකාශනය /ආපදා කළමනාකරණය /මූල්‍ය කළමනාකරණය
වත්කම් කළමනාකරණය සහ ගබඩා කළමනාකරණය	80	දින 02	32 720.00		දේශීය	වත්කම් සහ ගබඩා කළමනාකරණය පිළිබඳ දැනුම
Next Gen	60	දින 03	10 715.00		දේශීය	තොරතුරු තාක්ෂණික දැනුම
ධාරිතා සංවර්ධන වැඩසටහන	300	දින 02	2 49 555.00		දේශීය	කණ්ඩායම් කුසලතාව/නායකත්ව හැකියාව

<u>තොරතුරු දැනගැනීමේ පනත පිලිබඳ පුහුණු වැඩසටහන</u>





<u>ධාරිතා සංවර්ධනය පිලිබඳ පුහුණු වැඩසටහණ</u>







ඵලදායිතා පුහුණු වැඩසටහන







පරිගණක පුහුණුව පිලිබඳ වැඩසටහන





තාක්ෂණ නවීකරණ වැඩසටහන





නැපැල කළමණාකරනය වැඩසටහන





පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම **(මු.රෙ.445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල , ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදුවීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවති.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදුවීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවතී.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම.	අනුකූල වේ		

8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 216/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුකුව තිබූ හේස සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.16000 ක ශේෂයක් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	දිස්ත්‍රික් ලේකම් ආදායම් ගණන්දීමේ නිළධාරියෙකු නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රාජ්‍ය ප්‍රතිපත්ති මත වෙනස් වී ඇත.	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමටපහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම	අනුකූලවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු	අනුකූලවේ		

	පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්මතුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැකිවෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්දන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්ෙයෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිතුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		